**Arundathi Divisekara**
Attorney-at-Law
No.29/16, Priyadarsana Mawatha , Colombo-10.
Tel: +9471-7858646
E-mail: divisekara2013@gmail.com

ලියාපදිංචි තැපෑල මඟිනි.

**අගති රහිතයි.**

**එන්තරවාසිය**

2021.02.08

අධ්‍යක්ෂක ජනරාල්,
වනජීවි දෙපාර්තමේන්තුව,
811/A,
ජයන්තිපුර පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

මාගේ සේවාදායක වන ධර්මායතනය, අංක 381, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දරණ ස්ථානයේ වැඩවාසය කරන අති පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමිගේ උපදෙස් මත ලියා දන්වමි.

මාගේ සේවාදායක වෙතින් මා වෙත උපදෙස් ලැබී ඇත්තේ ඔබ හට 1937 අංක 02 දරණ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ අඥාපනත යටතේ ශ්‍රී ලංකාවේ සත්ත්ව හා ශාක හා ඒවායේ වාසස්ථාන ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම, ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම, එවැනි සත්ත්ව හා ශාක හා ඒවායේ වාසස්ථාන වාණිජ හා වෙනත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම හා ඒ සම්බන්ධ සිදුවීම් වැළැක්වීම සඳහා ඔබහට පැවරී ඇති බලතල හා කාර්යයන් ඉටු කිරීමට ඔබ විසින් දිගින් දිගටම පැහැර හැර සහ/හෝ අපොහොසත් වී ඇති බවයි.

ඒ අනුව මාගේ සේවාදායකගෙන් තවදුරටත් උපදෙස් ලැබී ඇත්තේ, මෙම ලිපිය ලද වහාම 1937 අංක 02 දරණ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ අඥාපනත යටතේ ඔබ හට ලැබී ඇති බලතල



Scanned with CamScanner

හා කාර්යයන් ඉටු කිරීමට ඔබ අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියොත් එකී පනතේ 66A වගන්තිය යටතේ හා දණ්ඩ නීති සංග්‍රහයේ 112 හා 289 වගන්ති යටතේ හා අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ ඔබටත්, ඔබ දෙපාර්තමේන්තුවේ අදාළ සිද්ධීන්ට වගකිවයුතු නිලධාරීන්ටත් විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසයි.

ස්තූතියි,

නීතීඥ අරුන්දතී දිවිසේකර

D. M. A. K. DIVISEKARA
LL.B (Hons) Colombo
Attorney - at- Law,
Commissioner for Oaths & Company Secretary.
70/5, Galatara Road, Ussapitiya.
Tel : 071 961 1695



Scanned with CamScanner